# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනම පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 පෙබරවාරි මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී).


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනම් පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

එල්. ඩී.—ඕ. 60/73.

**ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනම යනුවෙන් හැඳින්වෙන පදනමක් පිහිටුවීම පිණිස ද එහි පරමාර්ථ හා බලතල නියම කිරීම පිණිස ද ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (කෙටි නාමය.)

**2.** අභාවප්‍රාප්ත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා පිළිබඳ ගුණානුස්මරණය චිරස්ථායි කරනු පිණිස, ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනම යනුවෙන් හැඳින්වෙන හා මේ පනතෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක් පිහිටුවනු ලැබේ. (ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනම පිහිටුවීම.)

**3.** (1) පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වූ හා මේ පනතෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන කළමනාකාර මණ්ඩලයක් විසින් පදනම පරිපාලනය කළ යුතු ය :— (පදනමෙහි කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයෝ.)

(අ) අග්‍රාමාත්‍යවරයා ;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා ;

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා ;

(ඈ) විගණකාධිපතිවරයා ;

(ඉ) සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මහත්මියගේ ජීවිත කාලය තුළ එම මහත්මිය සහ ඉන් පසු අභාවප්‍රාප්ත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගෙන් පැවතෙන ජීවත්ව සිටින වැඩිමලා :

එසේ වුව ද සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මහත්මිය යම් කාලයක් සඳහා මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකාවක් නම් ඒ කාලය තුළ අභාවප්‍රාප්ත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගෙන් පැවතෙන ජීවත්ව සිටින වැඩිමලා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කළ යුතු ය :

එසේ ම තවදුරටත් ඒ ජීවත්ව සිටින වැඩිමලා එසේ කටයුතු කිරීමට අකමැති වන හෝ ඔහුට එසේ කටයුතු කිරීමට නොහැකි වන අවස්ථාවක, ජීවත්ව සිටින ඊළඟ වැඩිමලා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කළ යුතු ය ; තව ද

2—ඒ 11346—S947 (74/12)

(ඊ) විදේශ කටයුතු, නීතිය, අධ්‍යාපනය හෝ කලා පිළිබඳ පිළිගත් නිපුණත්වයක් හෝ විශිෂ්ටත්වයක් ඇති තැනැත්තන් අතුරින් ස්වකීය ජීවිත කාලය තුළ සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මහත්මිය විසින් ද ඉන් පසුව (ඉ) ඡේදයෙහි සඳහන් සාමාජිකයා විසින් ද පත් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක් :

එසේ වුව ද ඒ එක් එක් සාමාජිකයා ස්වකීය පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීමට ද සුදුසු වන්නේ ය.

(2) අග්‍රාමාත්‍යවරයා මණ්ඩලයේ සභාපති වන්නේ ය. යම් රැස්වීමකට අග්‍රාමාත්‍යවරයා නොපැමිණි විටක, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීම සඳහා ඔවුන් අතුරින් සභාපතිවරයකු පත් කර ගත යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් හා ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් ස්වකීය ක්‍රියා පටිපාටිය විධිමත් කරගත හැකි ය.

(5) මණ්ඩලයේ සාමාජිකයන් අතර ඇති යම් පුරප්පාඩුවක් නොතකා මණ්ඩලයට ක්‍රියා කළ හැකි ය.

පදනම සංස්ථාවක් වන බව.

4. පදනම, 2 වන වගන්තියෙන් ඊට දී ඇති නමින්, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද ඒ නමින් එය විසින් නඩු පැවරීම ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

පදනමේ මුද්‍රාව.

5. පදනමේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයෙහි තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය ; තව ද

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව හා මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිදු ලේඛනයකට නොතැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ලේඛනය අත්සන් කළ යුතු ය.

පදනමේ පරමාර්ථ.

6. පදනමේ අරමුණු හා පරමාර්ථ පහත සඳහන් පරිදි වන්නේ ය :—

(අ) ජාත්‍යන්තර සාමය, අවබෝධය හා සහයෝගතාවය වැඩි දියුණු කිරීම ;

(ආ) ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික, සංස්කෘතික හා සාමාජික ක්ෂේත්‍රයන්හි උද්ගත වන ජාත්‍යන්තර ප්‍රශ්න හැදෑරීම හා සාකච්ඡා කිරීම දිරි ගැන්වීම, සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීම; තව ද

(ඇ) පක්ෂග්‍රාහී දේශපාලනමය කාර්යයන් සඳහා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව පාවිච්චි කරනු නොලබන බවට සැලකිලිමත් වෙමින් ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා හා මණ්ඩලය සුදුසු යයි සලකන වෙනත් යම් කාර්යයක් සඳහා ඒ ශාලාව පවත්වා ගෙන යාම හා ප්‍රයෝජනයට ගැනීම.

7. (1) පදනමේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ වැඩදායී හෝ ඊට ආනුෂංගික වූ හෝ සියලු කටයුතු කිරීමට පදනමට බලය ඇත්තේ ය. පදනම සතු බලතල හා කාර්ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත සඳහන් බලතල හා කාර්ය පදනම සතු වන්නේ ය:—

(අ) දේශීය වූ හෝ විදේශීය වූ හෝ ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍යයෙන් ලැබෙන ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) මේ පනතින් හෝ යම් මිලදී ගැනීමක්, ප්‍රදානයක්, තෑග්ගක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් කරණ කොටගෙන හෝ අන්‍යාකාරයකින් පදනම සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීම හෝ දැරීම සහ සම්මන්ත්‍රණ ශාලාව හැර යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය කිරීම, ශිම්කර දීම, අන්තිම කැමැත්තකින් පැවරීම, පවරාදීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) අධ්‍යාපනික හා සංස්කෘතික කාර්යයන් සඳහා ආධාර මුදල්, පරිත්‍යාග මුදල් හෝ ශිෂ්‍යත්ව දීම;

(ඈ) පදනම සතු බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා ද පදනමෙහි පරමාර්ථ ඉෂ්ටකර ගැනීම සඳහා ද අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟ වීම්වලට කෙළින් ම හෝ ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ පදනමෙහි නිලධරයන් හා සේවකයන් හෝ අනුයෝජිතයන් මගින් හෝ එළඹීම හෝ එම ගිවිසුම් හෝ එකඟවීම් එසේ ඉටු කිරීම;

(ඉ) මේ පනතෙහි විධිවිධානවලට යටත්ව පදනමෙහි නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම හා ඔවුන්ගේ වේතන ගෙවීම ද ස්වකීය සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ වේතන ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය හා ඔවුන්ට නිවාඩු දීම හා වෙනත් ප්‍රතිලාභ දීම ද පිළිබඳ රීති සෑදීම;

(ඊ) සම්මන්ත්‍රණ ශාලාව කළමනාකරණය කිරීම හා නඩත්තු කිරීම ද සම්මන්ත්‍රණ ශාලාව හෝ එහි යම් කොටසක් පාවිච්චි කිරීම සඳහා හෝ මහජනයා විසින් සම්මන්ත්‍රණ ශාලාව හෝ එහි යම් කොටසක් නැරඹීම සඳහා ගාස්තු අය කිරීම ද සම්බන්ධයෙන් රීති සෑදීම;

(උ) භාර මුදල් ආයෝජනය කිරීම සඳහා නීතියෙන් බලය දෙනු ලැබූ යම් ආයෝජනයන්හි පදනමට අයත් අරමුදල් මණ්ඩලයේ අභිමතය අනුව ආයෝජනය කිරීම හා ඒ ආයෝජන මණ්ඩලයේ අභිමතය අනුව ආපසු ලබා ගැනීම, නැවත ආයෝජනය කිරීම හා වෙනස් කිරීම හා ඒ ආයෝජනවලින් ලැබෙන ආදායම ලබා ගැනීම; තව ද

(ඌ) පදනමේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ සියලු කාරණාවලට අදාළ රීති සෑදීම.

සම්මන්ත්‍රණ ශාලාව සතුකර දීම.

8. සම්මන්ත්‍රණ ශාලාව සහ එයට අනුබද්ධ භූමිභාගය වෙනස් කළ නොහැකි පරිද්දෙන් පදනම සතු වන අතර එම ශාලාව හා භූමිභාගය එසේ මෙයින් පදනම සතු කරනු ලැබේ.

පදනමේ අරමුදල.

9. (1) මේ පනතෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන "ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ පදනමේ අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබේ.

(2) අරමුදල කළමනාකරණය කිරීමේ, පාලනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය මණ්ඩලය සතු වන්නේ ය.

ආණ්ඩුව විසින් පදනමට වාර්ෂික ආධාර මුදලක් ප්‍රදානය කිරීම.

10. පදනමේ අරමුණු හා පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් ආධාර මුදලක් ආණ්ඩුව විසින් වාර්ෂිකව පදනමට ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

අරමුදලට කළ යුතු ගෙවීම්.

11. පහත සඳහන් මුදල් අරමුදලට ගෙවිය යුතු ය:—

(අ) මුදලින් කෙරෙන තෑගි හෝ පරිත්‍යාග;

(ආ) 10 වන වගන්තිය යටතේ ආණ්ඩුවෙන් ලැබුණු යම් ආධාර මුදලක්;

(ඇ) සම්මන්ත්‍රණ ශාලාව හෝ එහි යම් කොටසක් පාවිච්චි කිරීම සඳහා ගාස්තු අයකිරීමෙන් ලැබෙන යම් ආදායමක්;

(ඈ) සම්මන්ත්‍රණ ශාලාව හෝ එහි යම් කොටසක් මහජනයා විසින් නැරඹීම සඳහා ගාස්තු අයකිරීමෙන් ලැබෙන යම් ආදායමක්; සහ

(ඉ) ආයෝජනවලින් හෝ පදනමට අයවිය යුතු වෙනත් ලැබීම් වලින් හෝ ලැබෙන යම් ආදායමක්.

**12.** පහත සඳහන් කටයුතු සඳහා අවශ්‍ය සියලු වියදම් අරමුදලින් ගෙවිය යුතු ය :— අරමුදලින් කළ යුතු ගෙවීම්.

(අ) පදනම ක්‍රියාත්මක කිරීම, එහි ආයතන කටයුතු හා එය පවත්වා ගෙන යාම ;

(ආ) සම්මන්ත්‍රණ ශාලාව පවත්වා ගෙනයාමේ, එයට අමතර කොටස් එකතු කිරීමේ, එය වෙනස් කිරීමේ හෝ එය වැඩි දියුණු කිරීමේ වියදම ;

(ඇ) නිලධරයන්ට, මෙහෙකරුවන්ට හා වෙනත් සේවකයන්ට වැටුප් ගෙවීම ;

(ඈ) පදනමේ පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු ගෙවීම්.

**13.** (1) පදනමේ අදායම හා වියදම ද, වත්කම් හා බැරකම් ද වෙනත් සියලු ගණු දෙනු ද සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි ගණන් පොත් තැබීමට සැලැස්විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින පවත්නා පරිදි ස්මකීය ගණන් පොත් තුලනය කරවා ගැනීම ද ඒ දිනය තෙක් සකස් කරන ලද පදනමෙහි අය වැය ගිණුමක් සහ එදින තෙක් වූ වත්කම් හා බැරකම් පිළිබඳ සම්පිණ්ඩනයක් ඇතුළත් ශේෂ පත්‍රයක් ඊළඟ මාර්තු මස 31 වන දිනට පෙර පිළියෙල කරවා ගැනීම ද මණ්ඩලය විසින් කළ යුතු ය.

(3) අයවැය ගිණුම හා ශේෂ පත්‍රය මණ්ඩලයේ සභාපති විසින් ද ඒවා අත්සන් කිරීමට මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ සභාවේ වෙනත් යම් නිලධරයන් විසින් ද අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) පදනමෙහි ගණන් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(5) පදනම විසින්, වාර්ෂිකව, අවසාන වූ වර්ෂයේ පදනමේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් හා මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවක් පිළියෙල කළ යුතු අතර මුදල් තත්ත්වය පිළිබඳ එම වාර්තාව සුදුසුකම් ලත් විගණකවරයාගේ වාර්තාව ද සමග, එම මුදල් පිළිබඳ වාර්තාව අදාළ වන වර්ෂයට ඉක්බිතිව එළඹෙන වර්ෂය ඉකුත්වීමට පෙර, මහජනයාගේ දැනගැනීම සඳහා, ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

**14.** (1) පදනම විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ කිසිවක් වෙනුවෙන් කිසියම් තීරු බද්දක් ගෙවිය යුතු වීමෙන් පදනම නිදහස් වන්නේ ය. ඇතැම් තීරුබදු වලින් හා බදුවලින් පදනම නිදහස් කිරීම.

(2) 1963 අංක 4 දරන දේශීය ආදායම් බදු පනත යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දකින් හෝ ධන බද්දකින් පදනම නිදහස් වන්නේ ය.

(3) මහා නගර සහා ආඥාපනත යටතේ කිසියම් වරිපනම් බද්දක් ගෙවිය යුතු වීමෙන් පදනම නිදහස් වන්නේ ය.

(4) යම් තැනැත්තකු පදනමට තෑග්ගක් පිරිනමන අවස්ථාවක, එම තෑග්ගේ මුළු වටිනාකමේ ප්‍රමාණයට, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ තෑගි බද්ද ගෙවිය යුතු වීමෙන් ඒ තැනැත්තා නිදහස් වන්නේ ය.

(5) යම් තැනැත්තකු පදනමට පරිත්‍යාගයක් කරන අවස්ථාවක 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි කාර්යයන් සඳහා එම පරිත්‍යාගය අනුමත පරිත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පරිත්‍යාගයේ මුළු වටිනාකම වෙනුවෙන් ඒ පනත යටතේ සහනය ලැබීමට ඒ ත්‍යාගදායකයා හිමිකම් ලබන්නේ ය.

(6) 1963 අංක 4 දරන දේශීය ආදායම් බදු පනතෙහි හා මහා නගර සභා ආඥාපනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියෙහි විධිවිධාන බල පවත්වන්නේ ය.

රාජ්‍ය නිලධරයන් හා පළාත් පාලන සේවයේ සාමාජිකයන් පදනමේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

15. (1) රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එබඳු ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා, පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, රාජ්‍ය සේවයෙහි නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ හා එකී ලේකම්ගේ කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයෙහි නියුක්ත යම් නිලධරයකු පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතේ 9 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ විධිවිධාන, (ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි විධිවිධාන හැර) අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රාජ්‍ය සේවයෙහි නියුක්ත යම් නිලධරයකු පදනමේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතේ 9 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) නියමිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු පදනම විසින් සේවයෙහි යොදවා ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් පදනමට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයෙහි යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙන යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ ඒ ආයතනයේ කැමැත්ත ඇතිව, එබඳු ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා පදනමෙහි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය හා ඒ ලේකම් හෝ ඒ ආයතනය එකඟ වන නියම හා කොන්දේසි පිට, අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ හා පළාත් පාලන විෂයය භාර ලේකම්ගේ හෝ ඒ ආයතනයේ කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයෙහි වෙන යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් වන්නේ ය.

16. (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ මේ පනතේ කාර්යයන් සඳහා පත් කරනු ලැබූ පදනමේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් හෝ මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

මේ පනත යටතේ කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන් හා පදනමේ නිලධරයන් ආදීන් ආරක්ෂා කිරීම.

(2) පදනම විසින් හෝ එයට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී පදනම විසින් දරනු ලැබූ යම් වියදමක් පදනමේ මුදල්වලින් ගෙවිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී පදනමට ගෙවනු ලබන හෝ පදනම විසින් අයකර ගනු ලබන ගාස්තු කිසිවක් පදනමේ මුදල්වලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ කරනු ලැබූ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරනු ලැබූ යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යයි අධිකරණය තීරණය කරතහොත්, ඒ වියදම ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගෙන ඇතහොත් මිස, පදනමෙහි මුදල්වලින් ගෙවිය යුතු ය.

පදනමේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**17.** පදනමට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ පදනමේ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

පදනමේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රාජ්‍ය නිලධරයන් ලෙස සැලකෙන බව.

18. පදනමේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි—

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ;

"සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ලංකාවේ වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ සාමාජිකයකුව, ගණකාධිකාරී කෙනකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එම ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් හිමිව සිටින පුද්ගලයෙක් ; හෝ

(ආ) එම ආයතනයේ සාමාජිකයකුව, එක් එක් සාමාජිකයා ගණකාධිකාරී කෙනකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් හිමිව සිටින කොටස්කරුවන්ගෙන් යුත් වරලත් ගණකාධිකාරින්ගේ ව්‍යාපාරික ආයතනයක්

අදහස් වේ.

**7.** මේ පනත ආරම්භ වීමේ දිනයෙහි පවතින පරිදි ඉහත කී සමිතියේ සියලු ණය සහ බැඳීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර මේ පනත ආරම්භ වීමේ දිනයෙහි පවතින පරිදි එකී සමිතියට ලැබිය යුතු සියලු ණය සහ එකී සමිතියට ලැබිය යුතු හා ගෙවිය යුතු දායක මුදල් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සමිතියෙන් අයවිය යුතු ණය සංස්ථාව විසින් ගෙවිය යුතු බව සහ සමිතියට ලැබිය යුතු ණය සංස්ථාවට ගෙවිය යුතු බව.

**8.** සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා ගත යුතු සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන මොවුන්ගෙන් සහ තවත් සාමාජිකයන් හව දෙනකුගෙන් සමන්විත විය යුතු සංස්ථාවේ කාරක සභාව විසින් සංස්ථාවේ කටයුතු තත් කාලයේ වලංගු රීතිවලට යටත්ව පාලනය කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු පාලනය කිරීම.

**9.** (1) මේ පනත ආරම්භ වීමේ දිනයෙහි වලංගුව පවත්නා එකී සමිතියේ රීති සංස්ථාවේ ප්‍රථම රීති විය යුතු ය.

සංස්ථාවේ රීති.

(2) සංස්ථාවේ මහා සභා රැස්වීමක දී එම රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් සංස්ථාව විසින් ඉහත කී සියලුම රීති හෝ ඉන් කිසිවක් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ ඒ රීතිවලට අලුත් රීති එකතු කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

**10.** සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ වලංගු රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන් රීතිවලට යටත් විය යුතු බව.

**11.** මේ පනතේ සඳහන් රාජ්‍ය මණ්ඩල, සංස්ථා හෝ තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන්ගේ මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් කිසි තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ වෙනත් රාජ්‍ය මණ්ඩලවල හෝ සංස්ථාවල අයිතිවාසිකම් අත් හැරීම.